# ප්‍රතිමාගෘහ

ආචාර්ය ඇලෙක්සැන්ඩර් කපුකොටුව

සිද්ධාර්ථ බෝධිසත්වයෝ ක්‍රි. පූ. හයවන සියවසේ දී දඹදිව ලුම්බිණි නම් ස්ථානයේ උපත ලබා බුද්ධගයාවේ දී සම්බුද්ධත්වයට පත් වී අවුරුදු 45 ක් ධර්මය දේශනා කොට කුසිනාරා නුවර දී පිරිනිවන් පෑ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. උන්වහන්සේ දේශනා කළ එම සද්ධර්මය නිසාම උත්තරීතර අතිමානුෂික පුද්ගලයෙකු බවට පත්වූ බුදුරජාණන් වහන්සේට වැඳුම් පිදුම් කරන්නට උන්වහන්සේගේ අනුගාමිකයන් මෙන් ම බෞද්ධාගමිකයන් උත්සාහ කළ බව සඳහන් වේ (විමලරතන හිමි, 1995). කෙසේ වෙතත් බුද්ධ පරිනිර්වාණයෙන් බොහෝ කාලයක් ගත වන තෙක්ම බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය නොවූ බව ඒ පිළිබඳ අදහස් දක්වන බොහෝ වියතුන්ගේ මතයයි. ඒ අනුව උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් සියවස් තුනක් පමණ ගත වීමෙන් පසුව ඉන්දියාවේ නිර්මාණය කරන ලද සාංචි හා භාරුත් (ක්‍රි. පූ. 2) කැටයම් අතර බුද්ධ ප්‍රතිමාවක් හෝ උන්වහන්සේගේ රූපයක් පවා දක්නට නොමැත. එම කැටයම් අතර උන්වහන්සේ වෙනුවට යොදා ඇත්තේ බෝධිවෘක්ෂය, ස්ථූපය, ධර්මචක්‍රය, වජ්‍රාසනය, සිරිපතුල් යුග්මය, ඡත්‍රය, චාමරය ආදී සංකේතයන්ය. බොහෝවිට බුද්ධ ප්‍රතිමා වන්දනාව ආරම්භ වන්නට ඇත්තේ ක්‍රි. පූ. 1 වන සියවස තුළ හෝ ක්‍රි. ව. 1 සියවස යන කාලය තුළ වීමට බොහෝ දුරට ඉඩ ඇති බව ඒ පිළිබඳ අදහස් දක්වන වියතුන්ගේ මතයයි. ඒ අනුව බුද්ධ ප්‍රතිමාව වන්දනාවට

යොදාගැනීමත් සමග පිළිම ගෙවල් හෙවත් ප්‍රතිමා ගෘහ නිර්මාණය කිරීමට පටන්ගෙන ඇත (මාරසිංහ, 1993).

අනුරාධපුර විහාරාරාම ආශ්‍රිතව වාස්තු විද්‍යාත්මක නටබුන් අතර පිළිමගෙවල් වැදගත් විශේෂාංගයක් ලෙසට නිර්මාණය කර තිබූ බවට පුරාවිද්‍යාත්මක සාධක රැසක් හමුවේ. පාලි සාහිත්‍ය කෘතිවල මෙම පිළිමගෙවල් ගන්ධකුටි ලෙසට හඳුන්වා ඇත (සමන්තපාසාදිකාව, 1929). ඊට හේතු වූයේ බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ වැඩ විසූ සැවැත්නුවර ජේතවනාරාමය වැනි ස්ථානවල තිබූ ගන්ධකුටිය සැලකිල්ලට ගනිමින් විය හැකිය.

අනුරාධපුර යුගයේ මූලාශ්‍රගත තොරතුරුවලට අනුව මෙරට ප්‍රතිමාගෘහයක් පිළිබඳ ප්‍රථම වරට තොරතුරු අනාවරණය වන්නේ ක්‍රි. ව. පළමු වන සියවසේ වසභ රාජ්‍ය සමය තුළ දී ය මහාවංශය, 1963). ඒ අනුව වසභ රජතුමා මහාබෝධි අංගනයේ බුදුපිළිම හතරක් කරවා ඒවාට ප්‍රතිමා ගෘහයක් කරවූ බව මහාවංශයේ සඳහන් වේ. ඉන්පසු ක්‍රි. ව. තුන්වන සියවසේ මහසෙන් රාජ්‍ය සමයේ දී ද ප්‍රතිමා ගෘහයක් කරවූ බව මහාවංසයේ සඳහන් කර තිබේ. එතුමා එම ප්‍රතිමාගෘහය නිර්මාණය කර ඇත්තේ අභයගිරි විහාර භූමියේ ය. ක්‍රි.ව. හත්වන සියවස පමණ වන විට බුද්ධ ප්‍රතිමා සඳහා පමණක් නොව බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක ශ්‍රාවිකාවන් සඳහා ද ප්‍රතිමා මෙන්ම ප්‍රතිමාගෘහ ද නිර්මාණය කර ඇති බවට තොරතුරු අනාවරණය වේ. ඒ අනුව මහසෙන් රජුගේ පුත් කිත්සිරි මෙවන් රජතුමා මිහිඳු හිමියන් වෙනුවෙන් උන්වහන්සේගේ ශරීරයේ ප්‍රමාණයටම ප්‍රතිමාවක් කරවා ඒ සඳහා ප්‍රතිමාගෘහයක් නිර්මාණය කළ බව ද සඳහන් වේ (කුලතුංග, 1998). එසේම පළමු වන උපතිස්ස (ක්‍රි. ව. 368 - 410) ධාතුසේන (ක්‍රි.ව. 459 - 477) වැනි රජවරුන්ගේ කාලවල දී ද ප්‍රතිමා ගෙවල් නිර්මාණය කර ඇති බවට වංශකථාගත තොරතුරුවලින් පැහැදිලි වේ. තව ද හියුං සියැං හා පාහියං වාර්තාවල ද ශ්‍රී ලංකාවේ අනුරාධපුර විහාරාරාම ආශ්‍රිත නිර්මාණය කර තිබූ අති අලංකෘත

ප්‍රතිමාගෘහ පිළිබඳව තොරතුරු වාර්තා කර ඇත. ඉන් පසු අනුරාධපුර යුගයේ මෙන් ම පසුකාලීන යුගවල දී ද විවිධ රජවරුන් විසින් නිර්මාණය කරන ලද ප්‍රතිමාගෘහ පිළිබඳව හා ඒවාට කරන ලද විවිධ පරිත්‍යාග සම්බන්ධව සාහිත්‍ය මෙන් ම ශිලාලේඛන තොරතුරු වාර්තා වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රතිමාගෘහ නිර්මාණය පිළිබඳ වාස්තු විද්‍යාත්මක තොරතුරු සලකා බැලීමේ දී සම්ප්‍රදායන් කිහිපයක්ම දක්නට ලැබේ.

- ගන්ධකුටි සම්ප්‍රදාය
- ගෙඩිගේ සම්ප්‍රදාය
- මන්දිර හෙවත් ප්‍රාසාද සම්ප්‍රදාය
- ලෙන් විහාර සම්ප්‍රදාය
- ටැම්පිට විහාර සම්ප්‍රදාය

## ගන්ධකුටි සම්ප්‍රදාය


ගන්ධකුටි ප්‍රතිමාගෘහවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සලකා බැලීමේ දී එම ගෘහය ප්‍රධාන වශයෙන් ගර්භගෘහය හා මණ්ඩපය යන අංග දෙකකින් සමන්විත වේ. ගොඩනැගිල්ලේ පිටුපසින් වූ කොටස සමචතුරස්‍රාකාර හැඩයෙන් යුක්ත වන අතර ඒ තුළ බුද්ධ ප්‍රතිමාව තැන්පත් කර තිබූ නිසා එය පූජනීය කොටසයි. මෙහි බුද්ධ ප්‍රතිමාව තැන්පත් කරන ලද්දේ පිටිපස බිත්තියට ආසන්නවය. එසේ වුව ද ප්‍රතිමාව පසුපස බිත්තියට පිට දී ගැවෙන ලෙස නිර්මාණය කළේ නැත. ප්‍රතිමාවත් බිත්තියටත් අතරින් ගමන් කරමින් බැතිමතුන්ට ප්‍රදක්ෂිණා කිරීමට අවශ්‍ය ඉඩ ප්‍රමාණය එහි තබා ඇත (ගුණවර්ධන, 2009). අනුරාධපුර පංකුලිය ප්‍රතිමා ගෙය මේ සඳහා හොඳ නිදර්ශනයකි. නමුත් මැදිරිගිරියේ ප්‍රතිමාගෘහයේ බුද්ධ ප්‍රතිමාව තැන්පත් කොට තිබී ඇත්තේ පසුපස බිත්තියට සමීපව වීම නිසා ප්‍රදක්ෂිණා පථයක් සඳහා ඉඩ තබා තිබී නොතිබිණ. බොහෝවිට මෙම ගන්ධකුටි

සම්ප්‍රදායේ දී ප්‍රතිමාගෘහය නිර්මාණය කර තබා ඇත්තේ උස් වූ පාදමක් මතය. අනුරාධපුර විජයාරාමය හා තොලුවිල එබඳු උස් පාදම් මත ප්‍රතිමාගෘහ නිර්මාණය කර ඇති බව පෙනේ.

ගර්භගෘහය ඉදිරියෙන් නිර්මාණය කර තිබෙන්නේ ආයත චතුරස්‍රාකාර හැඩයෙන් යුක්ත මණ්ඩපය නමින් හඳුන්වන කොටසයි. ඊට ඇතුල්වීමට ප්‍රධාන දොරටුවක් ඇතුල් ගර්භයේ වූ ප්‍රතිමාවට මුහුණලා ඇති අතර ඊට අමතරව උප දොරටුවක් ද පැත්තකින් නිර්මාණය කොට තිබේ. බොහෝවිට ප්‍රධාන දොරටුව දකුණු දිසාවට මුහුණලා ඇති අතර උප දොරටුව විවර වී ඇත්තේ නැගෙනහිර දිසාවටය. එම උප දොරටුව පිටවීමේ දොරටුවක් ලෙස භාවිත කළා විය හැකිය. සමහර විට ප්‍රධාන දොරටුව තුළින් ඇතුල්වීම පිටවීම දෙකම සිදුකළ අතර උප දොරටුව පිටවීමට පමණක් භාවිතා කරන්නට ඇත. මෙම ප්‍රතිමාගෘහ පුළුස්සන ලද ගඩොල් හා දැව භාවිතයෙන් නිර්මාණය කර තිබූ බවට සාධක හමුවේ.



පංකුලිය ප්‍රතිමාගෘහය - ගන්ධකුටි සම්ප්‍රදාය



සැලසුම - පංකුලිය ප්‍රතිමාගෘහය

## ගෙඩිගේ සම්ප්‍රදාය

ගෙඩිගේ යනුවෙන් හඳුන්වන්නේ මුළු ගොඩනැගිල්ලම ගඩොල්වලින් නිර්මාණය කර තිබීම නිසාය. ගොඩනැගිල්ලේ බිත්ති මෙන්ම වහලය ද සකස් කර තිබෙන්නේ ගඩොල් වලින්මය. මෙම වර්ගයේ ප්‍රතිමා ගෙවල් ද සැකැස්ම අනුව ක්‍රම දෙකකට හඳුනාගත හැකිය.

- චතුරස්‍රාකාර බිම් සැලැස්මෙන් යුත් ගෙඩිගේ ප්‍රතිමා ගෘහය
- ගර්භගෘහය, අන්තරාලය හා මණ්ඩපය යන අංග තුනකින් සමන්විත ගෙඩිගේ ප්‍රතිමා ගෘහය යනුවෙනි.

මුලින්ම නිර්මාණය වූයේ චතුරස්‍රාකාර බිම් සැලැස්මෙන් යුත් ගෙඩිගේ ක්‍රමය වන අතර ප්‍රතිමාගෘහයේ ඉඩකඩ මදිවීම නිසා පසුකාලයේ දී ගෙඩිගේ ක්‍රමයට අන්තරාලය හා මණ්ඩපය එක්වන්නට ඇත. මෙහි දී මෙම ක්‍රම දෙකේ දී ම බුද්ධ ප්‍රතිමාව තැන්පත් කර තිබුණේ ගර්භගෘහය තුළය. ගෙඩිගේ සම්ප්‍රදායට අයත් පිළිමගෙවල්වලට නිදසුන් ලෙස අනුරාධපුර ඇතුල් නුවර, මාලිගාවිල, අවුකන හා අනුරාධපුර අභයගිරි සමාධි බුද්ධ ප්‍රතිමා සම්බන්ධ ප්‍රතිමා ගෙවල් පෙන්වාදිය හැකිය (ගුණවර්ධන, 2009).



අනුරාධපුර ඇතුල් නුවර ගෙඩිගෙය

ගඩොල්වලට අමතරව මුළු ප්‍රතිමාගෘහයම ගලින් නිර්මාණය කර ඇති ගෙඩිගේ සම්ප්‍රදායට අයත් ප්‍රතිමාගෘහ ද දකින්ට ඇත. මාතලේ නාලන්දා ගෙඩිගේ ප්‍රතිමාගෘහය ඊට කදිම නිදසුනකි.


## මන්දිර හෙවත් ප්‍රාසාද සම්ප්‍රදාය


මන්දිරයක් හෙවත් ප්‍රාසාදයක් ලෙසට තනිමහලට හෝ මහල් කිහිපයකින් යුක්තව ඉදිකරන ලද විහාර බුදුමැදුරු මෙනමින් හඳුන්වනු ලැබේ. අනුරාධපුරයේ දී මහල් පිළිමගෙවල් ඉදිකළ බවට සාධක නොලැබෙන අතර පොළොන්නරු යුගයේ මෙවැනි මන්දිර හෙවත් ප්‍රාසාද පිළිම ගෙවල් ඉදිකළ බවට සාධක හමුවේ. පොළොන්නරු යුගයේ පළමුවන විජයබාහු රජු ඉදිකළ අටදාගෙය හා නිශ්ශංකමල්ල රජුගේ හැටදාගෙය ඊට කදිම නිදසුන් වේ. මෙවැනි පිළිමගෙවල් පහත මාලය බොහෝවිට පිළිම වහන්සේලා තැන්පත් කිරීමටත් ඉහළ මහලය ධාතූන් වහන්සේලා තැන්පත් කිරීමටත් යොදාගෙන තිබුණි. දළදා මාලිගාවල ඉතිහාසය ගත් කළ එම සම්ප්‍රදාය අනුව ඉදිකළ විහාර මන්දිර ලෙසට හැඳින්විය හැකිය. සංදේශ කාව්‍යවල එවැනි ප්‍රතිමාගෘහ ගැන බොහෝවිට සඳහන් වන අතර මහනුවර දළදා මාලිගය එම සම්ප්‍රදායට අයත් ප්‍රතිමා ගෘහයකි (Silva, 1988).

## ලෙන් විහාර සම්ප්‍රදාය

ලෙනක් හෙවත් ගල්ගුහාවක් පදනම් කරගෙන එතුළ බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කර සකස්කර ගත් බුදුමැදුර ලෙන් විහාර සම්ප්‍රදායට අයත් වේ. අනුරාධපුර යුගයේ මුල් අවධියේ ලෙන් ඇසුරුකර ගනිමින් භික්ෂූන් වහන්සේලා ආරාම තනාගෙන වැඩ වාසය කළ කාලවකවානුවේ මෙම සම්ප්‍රදාය වඩාත් ජනප්‍රිය විය. පසුකාලීනව ද මෙම ක්‍රමය නොකඩවා පැවති අතර උඩරට රාජධානි සමයේ දී නැවතත් මෙම සම්ප්‍රදාය වඩාත් ජනප්‍රිය වී ඇති අතර එම උඩරට රාජධානි සමයේ නිර්මාණය කරන ලද

ලෙන් විහාර අදටත් ඉතා හොඳ තත්ත්වයෙන් පවතී. දඹුල්ල ලෙන් විහාර සංකීර්ණය අනුරාධපුර යුගයේ සිට උඩරට රාජධානි සමය දක්වා වූ කාලයට අයත් ඊට හොඳ නිදසුනකි (Bandaranayake, 1974).






දඹුල්ල ලෙන් විහාරය - අභ්‍යන්තර ප්‍රතිමා

## වැම්පිට විහාර සම්ප්‍රදාය

තැනිතලා පොළව මත ගල්කණු සිටුවා දිග අතට හා හරස් අතට දැව බාල්ක යොදා එම සැකිල්ල මත සනකමින් යුතු ලෑලි අතුරා එම ලෑලි මත වරිච්චි බිත්ති බැඳ ඉදිකරගන්නා කුඩා

ප්‍රමාණයේ විහාර මැදුර මෙම නමින් හැඳින්වේ. බොහෝවිට තෙතමනයෙන් හා වේයන් වැනි සතුන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා ගල් කණු මත මෙම ඉදිකිරීම කරන ලදි. අනුරාධපුර අවධියේ සිටම උඩරට රාජධානි අවධිය අවසානය දක්වාම මෙම සම්ප්‍රදායට අනුව විහාර මන්දිර නිර්මාණය කර ඇති බවට සාධක හමුවේ. මේ සඳහා ගල්කුට්ටි, ගල් පතුරු, ගල්කණු යන විවිධ ශෛලමය අංග උපයෝගී කරගෙන ඇති බව පෙනේ. එසේම තනිමහල් හා දෙමහල් ටැම්පිට විහාර මෙන්ම සමහර ටැම්පිට විහාර වටේට ප්‍රදක්ෂිණාපථ සකස් කරගෙන ඇත. ප්‍රධාන බිත්ති හතරෙන් පරිබාහිරව ඉදිකර ඇති ප්‍රදක්ෂිණාපථය වටේට ඉදිකර ඇත්තේ කොට වරිච්චි බිත්තියක්ය. දෙමහල් ටැම්පිට විහාරවලට උදාහරණ ලෙස බුදුමුත්තාව, දන්තුරේ, අනුරාගොඩ, අම්බුලුගල, බිංගිරිය වැනි ටැම්පිට විහාර පෙන්වා දිය හැකිය.



ටැම්පිට විහාරය බිංගිරිය

## ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය


- මහාවංසය, 1963, හික්කඩුවේ සුමංගල, හා බටුවන්තුඩාව, (සංස්.) රත්නාකර පොත් සමාගම, කොළඹ.
- සමන්තපාසාදිකාව, 1929, බද්දේගම පියරතන හිමි හා වැලිවිටියේ සෝරත හිමි (සංස්.) හේවාවිතාරණ මුද්‍රණාලය, කොළඹ 10.
- කුලතුංග ටී. ජී., 1998, අභයගිරි විහාරය, මධ්‍යම සංස්කෘතික අරමුදල.
- ගුණවර්ධන ප්‍රිශාන්ත, 2009, පුරාවිද්‍යාව (ශ්‍රී ලංකාවේ බහු ජාතික එකමුතුව සහ වාස්තු විද්‍යා උරුමය), ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.
- මාරසිංහ වෝල්ටර්, 1993, මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍ර, කර්තෘ ප්‍රකාශන.
- විමලරතන හිමි බෙල්ලන්විල, 1995, බුද්ධ ප්‍රතිමා කලාව සහ බුදු පිළිමයේ විකාශය, ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්, නැදිමාල, දෙහිවල.
- Bandaranayake S., 1974, **Sinhalese Monastic Architecture**, Netherland.
- Silva Roland, 1988, **Religious Architecture in Early and Medieval Sri Lanka**, Meppel.